දෙපාර්තමේන්තු චක්‍රලේඛ 07/2024

මගේ අංකය: DAPH/AD/16/02/06
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2024.07. 10

සියළුම පළාත් අධ්‍යක්ෂවරුන් (පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව)
සියළුම තාක්ෂණික අධ්‍යක්ෂවරුන්

<u>නිලධාරීන්ගේ කාර්යාල වේලාව සම්බන්ධයෙනි</u>

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2012.03.21 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2012 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයෙහි සඳහන් පළාත් පශු වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී වේලාව සම්බන්ධ විධිවිධාන මෙයින් අවලංගු කරනු ලැබේ.

03. ඒ අනුව රජයේ පශු වෛද්‍ය කාර්යාල වල නිලධාරීන්ගේ කාර්යාල වේලාව පහත පරිදි සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

i. කනිෂ්ඨ සේවකයන් හැර අනෙකුත් සියළුම නිලධාරීන්ගේ කාර්යාල වේලාව,
   සතියේ දින වල පෙ.ව 8.30 - ප.ව 4.00 දක්වා
   සෙනසුරාදා දින පෙ.ව 8.30 - ප.ව 12.00 දක්වා

ii. කනිෂ්ඨ සේවකයන්ගේ කාර්යාල වේලාව,
   සතියේ දින වල පෙ.ව 8.00 - ප.ව 4.30 දක්වා
   සෙනසුරාදා දින පෙ.ව 8.00 - ප.ව 12.30 දක්වා

04. මධ්‍යම රජය යටතේ හා පළාත් කාර්යාල ආශ්‍රිතව සේවය කරන නිලධාරීන්,

i. කනිෂ්ඨ සේවකයන් හැර අනෙකුත් සියළුම නිලධාරීන්ගේ කාර්යාල වේලාව
   සතියේ දින වල පෙ.ව 8.30 - ප.ව 4.15

ii. කනිෂ්ඨ සේවකයන්ගේ කාර්යාල වේලාව,
   සතියේ දින වල පෙ.ව 8.00 - ප.ව 4.45 දක්වා

ii. සති අන්තයන් නිවාඩු දින වේ.

05. පශු වෛද්‍යවරුන්ට හා පශු පර්යේෂණ නිලධාරීන්ට සතුන්ගේ සෞඛ්‍ය තත්වයන් මනාව පවත්වා ගැනීමත්, රෝග පැතිරීම වළක්වාලීම සඳහාත් ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයෙහි, XXX වැනි පරිච්ඡේදයෙහි 1.4 වගන්තිය අනුව රාජකාරී වේලාවෙන් පරිබාහිර, සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා පුද්ගලික සේවයේ යෙදීමට අවසර ඇත.

06. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 අනුව සියලුම නිලධාරීන් විසින් ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍රය භාවිතා කිරීම මගින් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කලයුතු වේ.

07. මෙම චක්‍රලේඛය 2024.08.01 දින සිට බලාත්මක වන පරිදි නිකුත් කරනු ලැබේ.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල

අධ්‍යක්ෂ ජනරාල්

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පිටපත් :

| | | |
|---|---|---|
| i. | ලේකම්, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස |
| ii. | ලේකම්, විෂයභාර පළාත් අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස හා අ.ක.ස |
| iii. | ප්‍රධාන ලේකම් (බස්නාහිර /දකුණ/මධ්‍යම/සබරගමුව/ඌව/වයඹ/ උතුරුමැද/උතුර/නැගෙනහිර) | - කා.දැ.ගැ.ස හා අ.ක.ස |
| iv. | සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් | - කා.දැ.ගැ.ස හා අ.ක.ස |
| v. | අධ්‍යක්ෂ (පරිපාලන) | - කා.දැ.ගැ.ස හා අ.ක.ස |
| vi. | ප්‍රධාන ගණකාධිකාරී / ප්‍රධාන අභ්‍යන්තර විගණක / ඉංජිනේරු | - කා.දැ.ගැ.ස හා අ.ක.ස |
| vii. | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය | - කා.දැ.ගැ.ස හා අ.ක.ස |
| viii. | විගණකාධිපති | - කා.දැ.ගැ.ස. |